සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

21 | S | I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

Third Term Test - Grade 13 - 2019

විභාග අංකය ....

ආර්ථික විද්‍යාව I

කාලය පැය දෙකයි

- ❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- ❖ **නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න. (පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ)**

01. පහත දැක්වෙන කරුණු අතුරෙන් සාර්ව ආර්ථික විද්‍යා සංකල්පයක් වන්නේ කවරක්ද?
    1. ආන්තික පිරිවැය
    2. හිඟකම
    3. විකල්ප අතුරෙන් තේරීම් කිරීම
    4. ආයතනයක් නිෂ්පාදන පිරිවැය
    5. ආයෝජනය

02. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    1. සමාජයේ වුවමනාවලට සාපේක්ෂව සැපයුම සීමා සහිත හෝ හිඟකමක් ඇති හෝ සම්පත් නොමිල සම්පත් ලෙස හැඳින්වේ.
    2. ස්වභාව ධර්මයෙන් නොමිලයේ ලැබෙන හා ආවස්ථික පිරිවැයක් සහිත සම්පත් මෙන්ම නිෂ්පාදනයේදී හිඟකමක් සහිත සම්පත් ආර්ථික නොවන සම්පත් වේ.
    3. ආර්ථික භාණ්ඩ හිඟ සම්පත් යොදාගෙන නිපදවනු ලබන බැවින් ඒවාට මිලක්ද නොපවතින අතර, තේරීම් පිළිබඳ ප්‍රශ්නයක් නොපවතී.
    4. ස්වභාව ධර්මයෙන් නොමිලේ හා ආවස්ථික පිරිවැය නොදරන සම්පත් මෙන්ම හිඟකමක් රහිත සම්පත් ආර්ථික නොවන සම්පත් වේ.
    5. ආර්ථික නොවන භාණ්ඩ කිසි විටකත් ආර්ථික භාණ්ඩ බවට පත් නොවුවද ආර්ථික භාණ්ඩ ආර්ථික නොවන භාණ්ඩ බවට පත්වන අවස්ථා පවතී.

03. වෙළඳපොළ ආර්ථික පද්ධතියක මෙන්ම සැලසුම්ගත ආර්ථික පද්ධතියකද මිලට කිසියම් කාර්යයක් පැවරේ. සැලසුම්ගත ආර්ථිකයක මිලෙහි කාර්යයක් වන්නේ,
    1. ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමට මඟ පෙන්වීම.
    2. සෑම භාණ්ඩයකම මිල ස්ථාවරව පවත්වා ගැනීම
    3. නිෂ්පාදකයාට තොරතුරු හා සංඥා සැපයීම.
    4. අභ්‍යන්තර ස්ථායිතාවට මඟ පෙන්වීම.
    5. ආර්ථික සැලසුම් සකස් කර ගැනීමේ උපකරණයක් වීම.

04. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ශ්‍රී ලංකාවට එරෙහිව ආර්ථික සම්බාධක පැනවුවහොත් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන හැකියා වක්‍රය වමට විතැන්විය හැක්කේ.
    1. ශ්‍රී ලංකාවට පැමිණෙනසංචාරකයින්ට සීමා පැනවෙන නිසා
    2. ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ අපනයනය අත්හිටුවීම නිසා
    3. ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ විදේශ රැකියා තහනම් කිරීම නිසා
    4. ශ්‍රී ලංකාවට සැපයෙන යෙදවුම් අත්හිටුවීම නිසා
    5. ශ්‍රී ලංකාවේ වැසියන්ගේ විදේශ සංචාර සීමා කිරීම නිසා

05. ඉල්ලුම් වක්‍රයක් මත ලක්ෂ්‍යයන් අතර ගමන් කිරීමකින්,
    1. ඉල්ලුම වෙනස්වීම නිරූපනය කරයි.
    2. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වෙනස්වීම නිරූපනය කරයි.
    3. ඉල්ලුම අඩු හෝ වැඩිවීම නිරූපනය කරයි.
    4. මිල හා ඉල්ලුම අතර අනුලෝම සම්බන්ධතාව නිරූපනය කරයි.
    5. ඉල්ලුම විතැන්වීම නිරූපනය කරයි.

06. පපහත දැක්වෙන ප්‍රස්තාර සටහන් යුගල දෙක නිරීක්ෂණය කරන්න.









	A හා B භාණ්ඩ	**C හා E භාණ්ඩ**
1.	අනුපුරක භාණ්ඩ වේ	ආදේශක භාණ්ඩ වේ
2.	බාල භාණ්ඩ වේ.	සාමානය භාණ්ඩ වේ.
3.	ගිෆන් භාණ්ඩ වේ.	සුඛෝපභෝගී භාණ්ඩ වේ.
4.	ආදේශක භාණ්ඩ වේ.	අනුපූරක භාණ්ඩ වේ.
5.	අනුපූරක භාණ්ඩ වේ.	අනවශ්‍ය භාණ්ඩ වේ.

07. එක්තරා භාණ්ඩයක මිල රු. 20දී ඉල්ලුම් ප්‍රමාණය ඒකක 200 කි. එම මිලේදී ඉල්ලුම් නම්‍යතාවය -1.5 කි. මිල 20% කින් ඉහළ ගියහොත් ඇති වියහැකි ප්‍රතිවිපාකය කුමක්ද?

	ඉල්ලුම් ප්‍රමාණය අඩුවීම	**පාරිභෝගික පැහැදම අඩුවීම**
1.	15%	140
2.	60%	640
3.	40%	640
4.	20%	240
5.	60%	360

08. තරගකාරී වෙළඳපොලක අලෙවි වන භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$$Qd = 20 - 2P, \quad Qs = 2P$$

මෙම භාණ්ඩ වෙළඳපල සමතුලිත අවස්ථාවේ නිෂ්පදකයා අපේක්ෂා කරන අවම ආදායම වන්නේ,

1. රු. 50.00 කි. 2. රු. 10.00 කි 3. රු. 60.00 කි 4. රු. 75.00 කි 5. රු. 25.00 කි

09. භාණ්ඩයක ඉල්ලුම වැඩිවන ප්‍රතිශතයට සමාන ප්‍රතිශතයකින් සැපයු අඩු වූ විට.
1. සමතුලිත මිල ඉහළ යන අතර සමතුලිත ප්‍රමාණය වෙනස් නොවේ.
2. සමතුලිත මිල හා ප්‍රමාණය ඉහළ යයි.
3. සමතුලිත මිල වෙනස් නොවන අතර සමතුලිත ප්‍රමාණය අඩුවේ.
4. සමතුලිත මිල පහළ යන අතර සමතුලිත ප්‍රමාණය වෙනස් නොවේ.
5. සමතුලිත මිල හා ප්‍රමාණය පහළ යයි.

10. එකතරා භාණ්ඩයක වෙළඳපල ඉල්ලුම් හා සැපයුම් සමීකරණ $Qd = 80 - 4P$ සහ $Qs = 4P$ වේ. මෙම භාණ්ඩයේ,

	සමතුලිත මිල	**අවම සැපයුම් මිල**	**උපරිම ඉල්ලුම් මිල**
1.	10	10	80
2.	8	10	60
3.	20	5	40
4.	10	0	20
5.	10	0	10

11. X භාණ්ඩයේ ඉල්ලුම් නම්‍යතාව -0.5 ක් සහ සැපයුම් නම්‍යතාව 2 ක් වේ යැයි සිතන්න. මෙම භාණ්ඩයට ඒකකයක් සඳහා රු. 4 ක බද්දක් පැනවූයේ නම් මෙම භාණ්ඩයේ මිල කොපමණ ප්‍රමාණයකින් ඉහළ යා හැකිද?
1. 3.20 කි 2.05 කි. 3. 4 කි. 4. 0.80 කි 5. 4 කි.

12. යම් භාණ්ඩයක නිෂ්පාදකයින්ට ඒකක සහනාධාරක් ලබාදුන් වට ඉන් වැඩි ප්‍රතිලාභයක් සාපේක්ෂව නිෂ්පාදකයින්ට හිමි වේ නම් එම භාණ්ඩයේ,
1. ඉල්ලුම් හා සැපයුම් නම්‍යතා ඒකීය වේ.
2. ඉල්ලුම් හා සැපයුම් නම්‍යතා නම්‍ය වේ.
3. ඉල්ලුම් හා සැපයුම් නම්‍යතා අනම්‍ය වේ.
4. ඉල්ලුමට සාපේක්ෂව සැපයුම නම්‍ය වේ.
5. ඉල්ලුමට සාපේක්ෂව සැපයුම අනම්‍ය වේ.

13. පහත රූප සටහනට අනුව දැක්වෙන සමතුලිත වූ භාණ්ඩ වෙළඳපලක උපරිම මිල සීමා පැන වූ අවස්ථාවකි.



මෙම රූප සටහනට අනුව අහිමි වූ ආර්ථික අතිරික්තය වනුයේ,
1. K 2. J සහ K 3. G,F,J සහ K
4. C සහ F 5. F, J සහ K

14. මිල ස්ථායිකිරීම සඳහා කෘෂිකාර්මික භාණ්ඩයක් මත සලාක පැනවීම මගින් වෙළඳ පල මිල ඉහළ මට්ටමක පවත්වාගත හැකි වුවද එසේ රජය වෙළඳපලට මැදිහත්වීමට ආර්ථික වශයෙන් අකාර්යක්ෂම ප්‍රතිපත්තියකි. මෙසේ වීමට හේතුවක් වන්නේ,
1. එමගින් ආර්ථිකයේ ඌන නිෂ්පාදනයක් බිහිවන බැවිනි.
2. එමගින් ආර්ථිකයේ අතිරික්ත නිෂ්පාදකයක් බිහිවන බැවිනි.
3. එමගින් වෙළඳපල අසමතුලිත වන බැවිනි.
4. එමගින් රජයට ඉහළ වාසියක් සැලසෙන බැවිනි.
5. එමගින් පාරිභෝගික අතිරික්තය අඩුව බැවිනි.

15. කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය තුළ විචල්‍ය යෙදවුම හීනවන ඵල පෙන්නුම් කරන විට,
1. මුළු ඵලදාව හා සාමාන්‍ය ඵලදාව අඩු වේ.
2. මුළු ඵලදාව හා සාමාන්‍ය ඵලදාව වැඩිවේ.
3. මුළු ඵලදාව අඩුවන අතර සාමාන්‍ය ඵලදාව වැඩිවේ.
4. මුළු ඵලදාව වැඩිවන අතර සාමාන්‍ය ඵලදාව අඩු වේ.
5. මුළු ඵලදාව වැඩිවන අතර සාමාන්‍ය ඵලදාව ස්ථාවර වේ.

16. කෙටිකාලයේදී පූර්ණ තරගකාරී ආයතනයක මුළු පිරිවැය රු. 20,000 හා සාමාන්‍ය ස්ථාවර පිරිවැය රු. 5 ක් වේ. මුළු අයභාරය රු. 25000 කි. ආයතනයේ මුළු නිමැවුම් මට්ටම ඒකක 900 කි. මෙම ආයතනයේ නිෂ්පාදන අතිරික්තය කොපමණ වේද?
1. රු. 9500 කි. 2. රු. 15500 කි 3. රු. 4500 කි 4. රු. 5000 කි 5. රු. 19100 කි

17. තරගකාරී වෙළපලක කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය සම්බන්ධයෙන් ස්වභාවික ඒකාධිකාරයක් බිහිවීමට බලපෑ හැකි සාධකය හඳුනා ගන්නත
1. රජයේ නීතිමය බාධා පැවතීම
2. වෙළඳපලට ප්‍රවේශවීමට බාධා පැවතීම
3. වෙළඳපල තොරතුරු පූර්ණව ලබාගත හැකිවීම
4. ප්‍රාග්ධන භාණ්ඩ භාවිතය පහසු වීම
5. නිෂ්පාදනයේ පරිමාණානුකූල පිරිමැසුම් පැවතීම

18. නිෂ්පදාන සාධයක සැපයුම් වක්‍රයේ නම්‍යතාව අඩුවන තරමට එම සාධකයේ
1. සංක්‍රාම ඉපයීම ක්‍රමයෙන් වැඩි වේ.
2. සංක්‍රාම ඉපයීම උපරිමය කරා ළගා වේ.
3. ඉපයීමෙන් වැඩි කොටසක් ආර්ථික බදු කුලියට අයත් වේ.
4. ඉපයීමෙන් සමානව ආර්ථික බදු කුලියට හා සංක්‍රාම ඉපයීමට අයත් වේ.
5. සංක්‍රාම ඉපයීම ආර්ථික බදු කුලියට වඩා සුළු ප්‍රමාණයකින් වැඩිවේ.

19. ජාතික ගිනුම්කරණයේ නිෂ්පාදන ඉම තුළට ඇතුලත් කර ගනනා ආර්ථික ක්‍රියාකාරකමක් නොවන්නේ මින් කවරක්ද?
1. නිෂ්පදානය කළ ආයතනය හැර සෙසු ආයතනික ඒකක සඳහා නිෂ්පාදනය කරන ලද සියලුම භාණ්ඩ හා සේවා
2. තමන්ගේ අවසන් පරිභෝජනය සඳහා නිෂ්පාදකයින් විසින් රඳවාගත් සියලුම භාණ්ඩ හා සේවා
3. තමන් සතුව ඇති තමන් පදිංචි වී සිටින නිවාස වලින් ලබාදෙන නේවාසික සේවය.
4. වැටුප් ලබාන සේවකයින් විසින් ඉටු කරන ලද ගෘහ සේවා.
5. ගෘහ ඒකකයේ සාමාජිකයින් විසින් තම තමන්ගේ පෞද්ගලික පරිභෝජන සඳහා ඉටුකරනු ලබන සේවාවන්

20. දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය + ශුද්ධ අපනයන + තොග වෙනස්වීම + වටිනාකම වෙනස්වීම සමාන වන්නේ,
1. දළ දේශීය ආයෝජන වලට 2. දේශීය ඉතුරුම් වලට 3. ජාතික ඉතුරුම් වලට
4. දළ දේශීය වියදමටය 5. දළ දේශීය නිෂ්පාදිතය මත කළ වියදමට

21. රටක වැයකළ හැකි කුටුම්බ ආදායම ගණනය කිරීමට භාවිතා කළහැකි නිවැරදිම ආකාරය වන්නේ,
1. දළ ජාතික ආදායම + සංක්‍රාම – ආදායම් බදු - අපනයන
2. දළ ජාතික ආදායම – කුටුම්බවලට නොලැබෙන ආදායම – ආදායම් බදු + සංක්‍රාම
3. දළ ජාතික ආදායම – වක්‍ර බදු + නොබෙදු ලාභ - සංක්‍රාම
4. දළ ජාතික ආදායම – සංක්‍රාම + වක්‍ර බදු + ක්ෂය වීම්
5. දළ ජාතික ආදායම – වක්‍ර බදු + සංක්‍රාම - කුටුම්බ වලට නොගෙවූ ආදායම

22. දළ ආයෝජන, ප්‍රාග්ධන පරිභෝජනයට වඩා අඩු වේ නම්,
1. ශුද්ධ ආයේජන ධන අගයක් ගනී. 2. දළ ආයෝජන ඍණ අගයක් ගනී
3. දළ ආයෝජන පහත වැටෙමින් පවතී. 4. ශුද්ධ ආයෝජන ඍණ වේ.
5. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය ඉහළ අගයක් ගනී.

23. එක්තරා කල්පිත ආර්ථිකයක ආදායම රු.මි. 140 ක් වන විට පරිභෝජන වියදම රු.මි. 132 ක් විය. ආදායම රු.මි. 160 ක් වන විට පරිභෝජන වියදම 148 ක් දක්වා වැඩි විය. ස්වාධීන ආයෝජන වියදම රු.මි. 100 ක් විය. මෙම ආර්ථිකයේ ආන්තික පරිභොජන නැම්යාව හා ආයෝජන වියදම් ගුණකයේ අගය පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. 0.75 හා 5 වේ. 2. 0.80 හා 4 වේ. 3. 0.80 හා 5 වේ.
4. 0.20 හා 4 වේ. 5. 0.60 හා 5 වේ.

24. එක්තරා කල්පිත ආර්ථිකයක ගුණකයෙහි අගය 4 ක් හා පරිභෝජන ශ්‍රිතය $C = 400 + 6y$ වේ යැයි සිතන්න. මෙම තොරතුරු සම්බන්ධයෙන් පහත දැක්වෙන පිළිතුරු අතරින් කවරක් වඩාත් නිවැරදි වේද?
1. $S = 400 + 0.75y$ 2. $C = 400 + 0.25y$ 3. $S = 100 + 0.75y$
4. $C = 400 + 0.75y$ 5. $C = 100 + 0.25y$

25. විවෘත ආර්ථික සමාහාර ඉල්ලුම අඩුවිය හැක්කේ,
1. අපනයන පහළ යාමෙනි. 2. ආනයන පහළ යාමෙනි. 3. බදු පහළ යාමෙනි.
4. ඉතුරුම් පහළ යාමෙනි. 5. සංක්‍රාම ලැබීම් ඉහළ යාමෙනි.

26. පහත සඳහහන් කවර සංසිද්ධියක් ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනයට හේතුවේද?
1. විදුලි බලයේ මිල පහළ යාම 2. යෙදවුම් වල මිල ඉහළ යාම
3. රාජ්‍ය වියදම් ඉහළ යාම 4. ආර්ථිකයේ වැටුප් මට්ටම ඉහළ යාම
5. පෞද්ගලික පාරිභෝජන වියදම් පහළ යාම

27. කිසියම් රටක මුදලේ සංසරණ ප්‍රවේගය 2.5 ක් වන අතර, මුදල් තොගය බිලියන 20 ක් ලෙස උපකල්පනය කළ හොත් එම රටෙහි දළ දේශීය නිෂ්පාදිතය
1. බිලියන 8 ක් වේ. 2. බිලියන 50 ක් වේ. 3. බිලියන 12 ක් වේ.
4. බිලියන 12 ක් වේ. 5. බිලියන 16 ක් වේ.

28. වාණිජ බැංකු පද්ධතියක එක් වාණිජ බැංකුවක් තුළ පුද්ගලයෙකු රු. 40,000 ක තම තැන්පතුවක ආරම්භ කරන ලදි. සංචිත අනුපාතය 40% ක් නම් ණය මැවීම සම්පූර්ණ කළවිට පද්ධතියට උපරිම වශයෙන් මුදල් සැපයුම කොපමණ වැඩිකළ හැකිද?,
   1. රුපියල් 100,000 ක් වේ.   2. රුපියල් 80,000 ක් වේ.   3. රුපියල් 160,000 ක් වේ.
   4. රුපියල් 60,000 ක් වේ.   5. රුපියල් 200,000 ක් වේ.

29. ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්තමාන මූල්‍ය ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධාන අරමුණ වන්නේ,
   1. මුදල් ඉලක්ක කාරණය හා නම්‍යශීලී උද්ධමන ඉලකක කරණයයි
   2. විවිට වෙළඳ කටයුතු සහ ප්‍රතිපත්ති පොලී අනුපාතය යොදාගැනීමයි.
   3. මුදල් ගුණකය භාවිතාකර උද්ධමනය පාලනය කිරීමයි.
   4. ආර්ථික ස්ථායිතාවය ආරක්ෂා කිරීමයි.
   5. මිල ස්ථායිතාවය ආරක්ෂා කිරීමයි.

30. මහ බැංකුව විසින් ප්‍රතිවිකුණුම් ඇතිකර ගැනීම හේතුවෙන් මුදල් වෙළඳපොලේ ද්‍රවශීලතා සැපයුමට හා ඒක්ෂ ණය වෙළඳපොලේ පොලී අනුපාතයට වන බැලපෑම වන්නේ,

	ද්‍රවශීලතා සැපයුම	**ඒක්ෂණ ණය වෙළඳපොලේ පොලී අනුපාතය**
1.	වැඩිවේ	පොලී ඉහළයෑම පටන් ගනී
2.	වැඩිවේ	පොලී පහළ සීමාව තීරණය වේ
3.	අඩුවේ	පොලී පහළ සීමාව තීරණය වේ
4.	වැඩිවේ	පොලී ඉහළ සීමාව තීරණය වේ
5.	අඩුවේ	පොලී ඉහළ යෑමට පටන් ගනී

31. ශ්‍රී ලංකාවේ මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමෙන් පසුව අත්වන ප්‍රතිලාභ කීපයක් පහත දැක්වේ. ඒවා අතුරින් ධන බාහිරතාවයක් ලෙස සැලකිය හැකි වන්නේ කවර බාහිරතාවයක්ද?
   1. මාර්ගය ඉදිකිරීමේදී අවට පරිසරයට හානි සිදුවීම.
   2. මඟී ජනතාවගේ කාලය ඉතිරිවීම
   3. අධිවේගී මාර්ගය අවට ඉඩම්වල මිල පහළ යාම
   4. අධිවේගී මාර්ගයෙන් ලැබෙන ආදායම ඉහළ යාම.
   5. මාර්ගවල සිදුවන රිය අනතුරු අඩුවීම.

32. ශුභ සාධන භාණ්ඩයක් යනුවෙන් අදහස් වන්නේ,
   1. පාරිභෝජනයේ පෞද්ගලික ප්‍රතිලාභ එහි සමාජ ප්‍රතිලාභ ඉක්මවා යන භාණ්ඩයකි.
   2. කෙනෙකුගේ පාරිභෝජනය නිසා තව කෙනෙකුගේ පාරිභෝජනය අහිමි නොවන භාණ්ඩයකි.
   3. පාරිභෝජනයේදී පෞද්ගලික ප්‍රතිලාභ ඉක්මවා සමාජ ප්‍රතිලාභ ලැබෙන භාණ්ඩයකි.
   4. මිලක් නොගෙවන අය පාරිභෝජනයෙන් බැහැර කළ නොහැකි භාණ්ඩයකි.
   5. එකිනෙකාගේ ආදායම් මට්ටම් අනුව පාරිභෝගිකයන් වෙත ලබාදෙන භාණ්ඩයකි.

33. 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පුනරාවත්තන වියදම හා ප්‍රාග්ධන වියදම වන්නේ,

	පුනරාවර්තන වියදම	**ප්‍රාග්ධන වියදම**
1.	14.5%	5.8%
2.	14.0%	5.5%
3.	19.2%	14.5%
4.	14.5%	4.8%
5.	16.2%	4.8%

34. රාජ්‍ය අයවැය ලේඛනය තුළ ඇති වර්තන ශේෂයේ හිඟයක් පවතීනම් එයින් අදහස් වන්නේ,
   1. රජයේ ප්‍රාග්ධන වියදම් අඩු කිරීමට සිදුවන බවයි.
   2. රජයේ එදිනෙදා ආර්ථික කටයුතු පවත්වාගෙන යාම සඳහත් රජයට ණය ගැනීමට සිදුවන බවයි.
   3. රජයේ ඉතුරුම් පවත්නා බැවින් අයවැය හිඟය අඩුවන බවයි.
   4. රජයේ වසරකට වැඩි කාලයක් පවත්නා මූර්ත වත්කම් අත්පත් කරගැනීමට මුදල් පවතින බවයි.
   5. රජයේ පවත්නා කටයුතු පවත්වාගෙ යාම සඳහා ගැටලුවක් නොමැති බවයි.

35. ගිණුම්කරන ප්‍රවේශය ඔස්සේ රාජ්‍ය අයවැයෙහි ශුද්ධ මූල්‍ය හිඟය ලෙස සැලකෙන්නේ,
   1. ණය පොලී ඇතුලත් නොකර ගණනය කරන වර්ථන ශේෂයයි.
   2. ණය පොලී ඇතුලත් නොකර ගණනය කරන සමස්ථ ශේෂයයි.
   3. රාජ්‍ය මුළුආදායමෙන් රාජ්‍ය මුළු වියදම් අඩුකළ පසු ලැබෙන ශේෂයයි.
   4. අයවැයේ සමස්ථ ශේෂයෙන් ණය වාරික ගෙවීම් අඩුකළ පසු ලැබෙන ශේෂයයි.
   5. ණය ආපසු ගෙවීම් ඇතුලත් සමස්ථ ශේෂයයි.

36. අන්තර් ජාතික වෙළඳාමක් ඇතිවීම සඳහා ඩේවිඩ් රිකාඩෝ විසින් ඉදිරිපත් කර ඇත සාපේක්ෂ වාසි න්‍යායේදී විශේෂයෙන් සලකා බලන්නේ,
   1. අඩු පිරිවැය න්‍යායයි. 2. ඉහළ ඵලදායිතා න්‍යායයි. 3. අඩු ආවස්ථික පිරිවැය න්‍යායයි
   4. අඩුම අකාර්යක්ෂමතාවයයි. 5. නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවයයි.

37. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවට සහ ඉන්දියාවට යතුරු පැදි 1 ක් සහ ගණක යන්ත්‍ර 1 ක් නිපදවීම සඳහා වැයවන ශ්‍රම පැය ගණනයි.

රට	සතුරු පැදි	ගණක යන්ත්‍ර
ශ්‍රී ලංකාව	100	50
ඉන්දියාව	120	80

ඉහත දත්ත අනුව විදේශ වෙළඳාම සම්බන්ධව එළැඹිය හැකි නිවැරදි නිගමනය වන්නේ,
   1. භාණ්ඩ දෙකම නිපදවීමේ නිරපේක්ෂවාසිය ඉන්දියාවට හිමිවන බවයි.
   2. භාණ්ඩ දෙකම නිපදවීමේ සාපේක්ෂ වාසිය ඉන්දියාවට හිමිවන බවයි.
   3. භාණ්ඩ දෙකම නිපදවීමේ සාපේක්ෂ වාසිය ශ්‍රී ලංකාවට හිමිවන බවයි.
   4. විදේශ වෙළඳාමට සම්බන්ධ වීමට කිසිම රටකට හැකි නොවන බවයි.
   5. භාණ්ඩ දෙකම නිපදවීමේ නිරපේක්ෂ වාසිය ශ්‍රී ලංකාවට හිමිවන බවයි.

38. කිසියම් රටක විදේශ වෙළඳ අනුපාතය පහත වැටී ඇතැයි නිගමනය කොට ඇත. ඒ සඳහා බලපෑහැකි සාධකයක් වනුයේ,
   1. අපනයන මිල දර්ශකය ඉහළයාම සහ ආපනයන මිල දර්ශකය පහළ යාම.
   2. අපනයන මිල දර්ශකයට වඩා වැඩි වේගයෙන් ආනයන මිල දර්ශකය පහත වැටීම.
   3. අපනයන මිල දර්ශකය ස්ථාවරව තිබියදී ආනයන මිල දර්ශනකය පහළ යාම.
   4. ආනයනය මිල දර්ශකය ස්ථාවරව තිබියදී අපනයන මිල දර්ශකය ඉහළ යාම.
   5. අපනයන මිල දර්ශකය ස්ථාවරව තිබියදී ආනයන මිල දර්ශකය ඉහළ යාම.

39. ශ්‍රී ලාංකික සමාගමක් සිංගප්පූරුවේ ඇගලුම් කම්හලක ආයෝජනයක් කිරීමෙන් මිලියන 200 ක් ලාභාංශ ලැබීම, ගෙවුම් ශේෂ ලේඛනයේ කුමන ගිණුමක ඇතුලත් කරනු ලැබේද?
   1. මූල්‍ය ගිණුම 2. ප්‍රාථමික ආදායම් ගිණුම 3. ද්විතීය ආදායම් ගිණුම
   4. භාණ්ඩ ගිණුම 5. සේවා ගිණුම

40. කිසියම් රටක් වෙනුවෙන් වෙනත් රටවල මහ බැංකුවල තැන්පත් කර තිබෙන විදේශ මුදල් සහ සුරැකුම්පත් හඳුන්වන්නේ,
   1. විදේශ සම්පත් පරතරය ලෙසයි 2. විදේශ සම්පත් ලෙසයි 3. විදේශ වත්කම් ලෙසයි
   4. විදේශ සෘජු ආයෝජන ලෙසයි 5. කළඹ ආයෝජන ලෙසයි.

41. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකා රුපියලේ ඩොලර් වටිනාකම තීරණය වන ආකාරයේ රූප සටහනකි. එහි රුපියල් සැපයුම් වක්‍රය දකුණට විතැන් වී රුපියලේ විදේශ අගය පහළ ගොස් තිබේ.



මේ සඳහා බලපෑහැකි ආසන්නතම හේතුව වන්නේ,
   1. GSP සහනය නිසා මාළු තොගයක් යුරෝපයට යැවීම
   2. ශ්‍රී ලංකාව විදේශ වලින් ගත් ණය ගෙවීම් වැඩිවීම.
   3. ගෙවුම් තුලන ලැබීම් වැඩිවීම.
   4. ශ්‍රී ලංකාව තුළ සිදුකරණ ත්‍රස්ත ප්‍රහාර නිසා විදේශ සංචාරකයින්ගේ පැමිණීම පහළ යාම.
   5. ආරක්ෂක තත්ත්වය යහපත් කිරීමෙන් පසු සංචාරකයින්ගේ පැමිණීම ඉහළ යාම

42. වෙළඳ ශේෂයේ දිගින් දිටම අයහපත් තත්ත්වයක පැවති ආර්ථිකයක් එයින් මිදීම සඳහා මුදල් අවප්‍රමාණය කිරීම තෝරාගනී . එය සාර්ථක වීම සඳහා වඩාත්ම ගැලපෙන ආනයන හා අපනයන ඉල්ලුම් නම්‍යතාවය වන්නේ,

	අපනයන ඉල්ලුම් නම්‍යතාවය	**ආනයන ඉල්ලුම් නම්‍යතාවය**
1.	0.1	0.2
2.	0.2	0.7
3.	0.3	0.9
4.	0.6	0.2
5.	0.9	0.2

43. ශ්‍රී ලංකාවේ අදාළ වර්ෂයේදී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රු. ට්‍රිලියන 240 ක් යැයි ද පෙර වර්ෂයේ මූර්ථ දල දේශීය නිෂ්පාදනය 228 ක් යැයිද උප කල්පනය කලවිට ආර්ථික වෘද්ධි අනුපාතය

1. 12% ක් වේ. 2. 6% ක් වේ. 3. 8 % ක් වේ. 4. 5 % ක් වේ. 5. 7% ක් වේ.

44. ලෝක බැංකුව විසින් ඒක පුද්ගල දළ ජාතික ආදායම අනුව රටවල් වර්ගීකරණ කිරීමේදී අඩු ආදායම් ලබන රටවල් ලෙස සලකනු ලබන්නේ ඒක පුද්ගල දල ජාතික ආදායම,

1. 995 ට අඩු රටවල් ය. 2. 925 ට අඩු රටවල් ය. 3. 1025 ට අඩු රටවල් ය.
4. 975 ට අඩු රටවල් ය. 5. 1035 ට අඩු රටවල් ය.

45. වර්තමාන ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය දෙස බලනවිට අඩුම දරිද්‍රතාවය සහිත දිස්ත්‍රික්කය සහ වැඩිම දරිද්‍රතාව සහිත දිස්ත්‍රික්කය වන්නේ,

	වැඩිම දරිද්‍රතාව	**අඩුම දරිද්‍රතාව**
1.	මොණරාගල	කළුතර
2.	මඩකලපුව	කොළඹ
3.	කිලිනොච්චිය	ගම්පහ
4.	මුලතිව්	කොළඹ
5.	කිලිනොච්චිය	කොළඹ

46. පහත දැක්වෙන්නේ නේපාලය හා ශ්‍රී ලංකාවේ වසර 3 ක් සඳහා ගිනි සංගුණකයේ අගය වෙනස්වී ඇති ආකාරයයි.

වර්ෂය	**නේපාලය**	**ශ්‍රී ලංකාව**
2014	0.60	0.65
2015	0.58	0.75
2016	Ō50	0.82

ඉහත දත්ත වලට අනුව ආදායම් ව්‍යාප්තියේ සිදුවන නිවැරදිම ප්‍රකාශය වන්නේ,

1. නේපාලයේ ලෝරන්ස් වක්‍රය ශ්‍රී ලංකාවේ ලෝරන්ස් වක්‍රයට වඩා වැඩි වේගයකින් සම ආදායම් ව්‍යාපාත්කි රේඛාවෙන් ඈත්වෙමින් පවතී.
2. ශ්‍රී ලංකාවේ ලෝරන්ස් වක්‍රය සම ආදායම් ව්‍යාප්ති රේඛාවෙන් ඈත්වෙමින් පවතී.
3. නේපාලයේ ආදායම් විසමතාවය වැඩිවෙමින් පවතින අතර, ශ්‍රී ලංකාවේ ආදායම් විසමතාව අඩුවෙමින් පවතී.
4. නේපාලයේ ලෝරන්ස් වක්‍රය සම අදායම් ව්‍යාප්ති රේඛාවෙන් ඈත්වෙමින් පවතින අතර, ශ්‍රී ලංකාවේ ලෝරන්ස් වක්‍රය සමාන රේඛාවට ආසන්න වෙමින් පවතී.
5. නේපාලයේ ලෝරන්ස් වක්‍රය සම ආදායම් ව්‍යාප්ති රේඛාවෙන් ඈත් වෙමින් පවතී.

47. මානව සංවර්ධන දර්ශකයට (HDI) අදාල කරගන්නා ප්‍රධාන මානයන් තුන හඳුනාගන්න.

1. දරිද්‍රතාවය, මානව සංවර්දනය, දීර්ඝායුෂ 2. ආර්ථික, සමාජ, පාරිසරික
3. දීර්ඝායුෂ, දැණුම, යහපත් ජීවන තත්ත්වය 4. අධ්‍යාපනය, සමාජීය, පාරිසරික
5. දීර්ඝායුෂ, ළදරුමරණ, උපත් අනුපාතය

48. ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය යනුවෙන් අදහස් වන්නේ,
   1. රටක ශ්‍රම බලකාය එරට වැඩකල හැකි වයසේ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි.
   2. සේවා නියුක්ත පුද්ගලයන්ගේ සංඛ්‍යාව වැඩකලහැකි වයසේ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි.
   3. විරැකියා අනුපාතය ශ්‍රම බලකායේ අනුපාතයක් ලෙස දැක්වීමයි.
   4. වැඩකළ හැකි වයසේ ජනසංඛ්‍යාව ශ්‍රම බලකායේ අනුපාතයක් ලෙස දැක්වීමයි.
   5. ශ්‍රම හමුදාව මුළුජන සංඛ්‍යාවේ අනුපාතයක් ලෙස දැක්වීමයි.

49. 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය අනුව සේවා නියුක්තිය නිවැරදිව දැක්වෙන පිළිතුර හඳුනා ගන්න.

	කෘෂිකාර්මික	**කාර්මික**	**සේවා**
1.	6.9%	26.8%	28.4%
2.	26.1%	28.4%	45.5%
3.	6.9%	26.8%	56.8%
4.	26.9%	27.6%	45.5%
5.	25.5%	28.5%	46.0%

50. දැනුම් ආර්ථිකය පිළිබඳ දර්ශකය සකස්කිරීම සඳහා යොදාගන්නා නිර්නායකය නොවන්නේ.
   1. සාමාන්‍ය තොරතුරු තාක්ෂණය හා යටිතල පහසුකම්
   2. ආර්ථික සානුබල සහ ආයතන ව්‍යුහය
   3. නව්‍යතාවයන් හා තාක්ෂණය උපයෝගී කරගැනීමේ නැඹුරුව
   4. මානව ප්‍රාග්ධනය හා පුහුණුව
   5. අධ්‍යාපනය හා පුහුණුව

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 S II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019
Third Term Test - Grade 13 - 2019

විභාග අංකය .... ආර්ථික විද්‍යාව II කාලය පැය තුනයි

❖ ''අ '' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද ''ආ'' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

අ උප කොටස

01). i. ආර්ථික නොවන භාණ්ඩ හා පොදු භාණ්ඩ අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. ආවස්ථික පිරිවැය යන්න පැහැදිලි කර ආවස්ථික පිරිවැය ශූන්‍ය අගයක් ගන්නා අවස්ථා පෙන්වා දෙන්න. (ලකුණු 3)

iii. රටක මානව සම්පත ප්‍රවර්ධනය කළ හැකි ක්‍රම 4 ක් ලියන්න. (ලකුණු 4)

iv. නිෂ්පාදන හැකියා මායිම සම්බන්ධ පහත සඳහන් අවස්ථා කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) නිෂ්පාදන හැකියා මායිම විතැන්වීමක් (ලකුණු 2)

(ආ) ආර්ථිකයක් නිෂ්පාදන හැකියා මායිමට වම්පස පිහිටි ලක්ෂයක කටයුතු කිරීම (ලකුණු 2)

v. (අ) ආර්ථික පද්ධතියක් යනුවෙන් කුමක් අදහස් වේද? (ලකුණු 1)

(ආ) නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ්නය වෙළඳපොල ආර්ථික පද්ධතියක විසදාගනු ලබන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

02). i. (අ) සාමාන්‍ය භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය පහතට බෑවුම් වන්නේ ඇයි? (ලකුණු 2)

(ආ) එළවළු සඳහා සාපේක්ෂ වශයෙන් අනම්‍ය ඉල්ලුමක් පවතී යැයි ඔබ සිතන්න. ගෝවා සඳහා ඉල්ලුමද මිල අනම්‍ය යැයි ඔබ නිගමනය කරන්නේද? හේතු දක්වන්න. (ලකුණු 2)

(ඇ) වමේ සිට දකුණට පහළට බෑවුම්වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයක විවිධ ලක්ෂ්‍ය මිල නම්‍යතා සංගුණක පෙන්නුම් කළද, ඉල්ලුම් වක්‍රය මත සෑම ලක්ෂ්‍යයකම එක හා සමාන වූ නම්‍යතා සංගුණක අගයන් පෙන්නුම් කරන අවස්ථා නම් කරන්න. (ලකුණු 3)

ii. ඉල්ලුම විතැන්වන විට භාණ්ඩයක සමතුලිත මිල හා ප්‍රමාණය කවර දිශාවකට වෙනස් වන්නේ දැයි රූප සටහන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. (අ) $Qd = 200 - 10P$ හා $Qs = 20 + 8P$ යන ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පදනම් කරගෙන සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)

(ආ) සමතුලිත මිලේදී ආර්ථික අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 5)

(ඇ) සමතුලිත මිලේදී සැපයුම් නම්‍යතාව කොපමණද? (ලකුණු 2)

03). i. නිෂ්පාදකයන් වෙත පනවනු ලබන ඒකක බද්දක් නිසා නිෂ්පාදකයාට ලැබෙන මිල ගැනුම්කරු ගෙවන මිල යන කරුණු තීරණය වීම කෙරෙහි සැපයුම් නම්‍යතාව බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 6)

ii. පහත දැක්වෙන ප්‍රස්තාරයෙන් පෙන්නුම් කරන්නේ සමතුලිත වෙළඳපලකට රජය මැදිහත්වී නිෂ්පාදන ඒකක සහනාධාරයක් ලබාදීමෙන් පසු වෙළඳපොල තත්ත්වයයි.



(අ) සහනාධාරය වෙනුවෙන් රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණද? (ලකුණු 2)

(ආ) සහනාධාරයෙන් පසු නිෂ්පාදන අතිරික්තය සොයන්න. (ලකුණු 2)

iii. සමතුලිත මිලට වඩා ඉහළින් අවම වැටුපක් නියම කිරීමෙන් ඇතිවිය හැකි ප්‍රතිවිපාක කවරේද? (ලකුණු 4)

iv. කාර්මික භාණ්ඩවල මිල අස්ථායිවීමට බලපාන හේතු කවරේද? එබඳු භාණ්ඩවල මිල ස්ථායිතාව තහවුරු කිරීම සඳහා ආණ්ඩුවට ගතහැකි ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු 6)

04). i. ස්ථාවර පිරිවැය, විචල්‍ය පිරිවැය, මුළු පිරිවැය යන සංකල්ප අතර දක්නට ලැබෙන සම්බන්ධතාව පරීක්ෂා කරන්න. (ලකුණු 6)

ii. පූර්ණ තරගකාරී වෙළඳපලක දිගු කාලයේදී ආයතනයකට ඉපයිය හැක්කේ ප්‍රාමාණික ලාභ පමණක්ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 3)

iii. පූර්ණ තරග හා කතිපයාධිකාරී වෙළඳපොල ව්‍යුහයන්හි දක්නට ලැබෙන ලක්ෂණ කවරේද? (ලකුණු 4)

iv. (අ) පූර්ණතරගකාරී ආයතනයක තීරණාත්මක පිරිවැය වක්‍ර තුන නම් කරන්න. (ලකුණු 3)

(ආ) කෙටි කාලයේදී පූර්ණ තරගාකරී ආයතනයක් පාඩු සහිතව කටයුතු කරන අවස්ථාවක් රූප සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

05). i. ජාතික ගිණුකම්රණයේදී ආර්ථික ප්‍රදේශය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 3)

ii. පහත දැක්වෙන්නේ කල්පිත සාර්ව ආර්ථික දත්ත සමූහයකි. (රු. මිලියන වලිනි)

නිෂ්පාදන අංශය	නිමැවුම් වටිනාකම	අතරමැදි පරිභෝජනය
කෘෂිකර්මාන්තය	4000	1000
කාර්මික අංශය	8000	3000
සේවා අංශය	12000	3600

- නිෂ්පාදකයාගෙන් අයකළ නිෂ්පාදිතය මත පනවන ලද බදු	1800
- නිෂ්පාදකයන්ට ලබාදුන් නිෂ්පාදිතය මත සහනාධාර	200
- වෙළඳ ආන්තික හා ප්‍රවාහන ගාස්තු	1000
- ආනයන මත පනවන ලද බදු	600
- පාරිභෝගිකයාගෙන් අය කළ නිෂ්පාදිතය මත පනවන ලද බදු	900
- පාරිභෝගිකයින්ට ලබාදුන් නිෂ්පාදිතය මත සහනාධාර	500
- ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම	-1200
- ශුද්ධ විදේශ වර්තන සංක්‍රාම	400
- ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය	1000

පහත සඳහන් අගයන් ගණනය කරන්න.

(අ) මූලික මිල යටතේ දළ එකතු කළ අගය. (ලකුණු 3)

(ආ) නිෂ්පාදකයාගේ මිලට දළ එකතු කළ අගය (ලකුණු 2)

(ඇ) දළ දේශීය නිෂ්පාදිතය / ගැනුම්කරුගේ මිල යටතේ දළ එකතුකළ අගය (ලකුණු 2)

(ඉ) ශුද්ධ දේශීය නිෂ්පාදිතය (ලකුණු 2)

(ඊ) දළ ජාතික ආදායම (ලකුණු 2)

iii. C = 200 + 0.8 Y (පරිභෝජන ශ්‍රිතය)

I = 200 (ආයෝජන)

G = 100 (රජයේ වියදම්)

(අ) මෙම ආර්ථිකයේ සමතුලිත නිමැවුම ගණනය කරන්න (ලකුණු 2)

(ආ) ඉහත තොරතුරු හා සමතුලිත නිමැවුම ප්‍රස්තාරයක් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 4)

ආ උප කොටස

(මෙම කොටසෙන්ද අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න)

06). i. පදනම් මුදල් යනුවෙන් කුමක් අදහස්වේද? ඒ සඳහා අයත්වන මහ බැංකුවේ ප්‍රධාන වගකීම් අයිතම සඳහන් කරන්න (ලකුණු 4)

ii. (අ) මුදල් සැපයුම හා මිල මට්ටම අතර සමීප සම්බන්ධතාවයක් පවතින්නේ ඇයිදැයි විනිමය සමීකරණය යොදාගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) කිසියම් ආර්ථිකයක මූර්ත දළ දේශීය නිෂ්පාදිතය මි.600 ක් ද මිල මට්ටම රු. 2 ක් ද මුදල් සැපයුම 300 ක් ද වේ නම් මුදලේ සංසරණ ප්‍රවේගය ගණනය කරන්න. (ලකුණු 2)

iii. පහත දැක්වෙන්නේ බැංකු පද්ධතියකට අදාළ තොරතුරු කීපයකි.

- ආර්ථිකයේ මුදල් සැපයුම රු.මි.	4400
- එයින් මහජනයා සතු ව්‍යවහාර මුදල්	400
- ඉල්ලුම් තැන්පතු රු.මි.	4000
- සංචිත අනුපාතය 10%	
- පද්ධතිය සතු සංචිත මුදල්	400
- ණය	3600

(අ) මෙම බැංකු පද්ධතියේ ශේෂ පත්‍රය සකස් කරන්න. (ලකුණු 2)

(ආ) සංචිත අනුපාතය 20% ලෙස මහ බැංකුව නියම කළේ නම් ණය මැවීම සම්පූර්ණ කළ විට ශේෂ පත්‍රය සහ ආර්ථිකයේ මුදල් සැපයුම ගණනය කරන්න. (ලකුණු 4)

iv. මහ බැංකුව ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රති විකුණුම් මගින් ආර්ථිකයේ මුදල් සැපයුම පාලනය කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. මහ බැංකුවේ ගුණාත්මක ණය පාලන ක්‍රම 4 ක් නම් කරන්න. (ලකුණු 2)

07). i. වෙළෙඳපොලක් තුළ අධි පාරිභෝජනයක් සිදුවන අවස්ථාවක් නිසා වෙළඳපොල අසමත්වන ආකාරය රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. වෙළෙඳපොල ආර්ථිකයක රජයේ කාර්යයන් මොනවාද? (ලකුණු 4)

iii. රාජ්‍ය අයවැයෙහි වර්තන වියදම්, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය සැපයුම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 3)

iv. වර්තමාන ශ්‍රී ලංකාවේ බදු අයභාරයේ ප්‍රධාන මූලාශ්‍ර කවරේද? (ලකුණු 4)

v. අයවැය හිඟය පියවා ගැනීම සඳහා යොදාගන්නා ප්‍රසාරණාත්මක ණය මාර්ග හා ප්‍රසාරණාත්මක නොවන ණය මාර්ග වෙන් වෙන්ව සඳහන් කරන්න. (ලකුණු 5)

08). i. 2018 අවසාන වනවිට ශ්‍රී ලංකාව විසින් අත්සන් කොට ඇති වෙළෙඳ ගිවිසුම් දෙකක් සහ සාකච්ඡා මට්ටමේ පවත්නා වෙළෙඳ ගිවිසුම් දෙකක් නම් කරන්න. (ලකුණු 4)

ii. විදේශ වෙළෙඳාමේ තරගකාරිත් වාසියට තුඩුදෙන මූලාශ්‍ර මොනවාද? (ලකුණු 2)

iii. පාලිතනම්‍ය (Managed Float) විනිමය අනුපාතය යනුවෙන් කුමක් අදහස් වේද?. විනිමය අනුපාතය තීරණය කරන සාධක 4 ක් නම් කරන්න. (ලකුණු 5)

iv. රටක විදේශ සම්පත් පරතරය හා විදේශ වත්කම් අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. පහත දැක්වෙන්නේ ගෙවුම් ශේෂ ලේඛනයේ දත්ත සමහරකි.

- වෙළඳ භාණ්ඩ අපනයන	100	- රජයේ සංක්‍රාම ලැබීම්	25
- වෙළඳ භාණ්ඩ ආනයන	120	- මුහුදු ප්‍රවාහන ලැබීම්	220
- මූල්‍ය සේවා ලැබීම්	250	- පොලී ගෙවීම්	35
- ගුවන් ප්‍රවාහන ලැබීම්	150	- සේවා නියුක්ති ප්‍රේෂණ ලැබීම්	340
		- සේවා නියුක්ති ගෙවීම්	40
- ලාභාංශ ලැබීම්	100	- සංචාරක ලැබීම්	140
- මූල්‍ය සේවා ගෙවීම්	300	- සංචාරක ගෙවීම්	100
- ලාභාංශ ගෙවීම්	80	- විදුලි සංදේශ ලැබීම්	75
- ගුවන් ප්‍රවාහන ගෙවීම්	60	- විදුලි සංදේශ ගෙවීම්	60
- පොලී ලැබීම්	130	- මූල්‍ය නොවන රන් ලැබීම්	50
		- මූල්‍ය නොව රන් ගෙවීම්	110
		- මුහුදු ප්‍රවාහන ගෙවීම්	80

(අ) වෙළඳ ශේෂය (ආ) භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය

(ඉ) ප්‍රාථමික ආදායම් ශේෂය (ඊ) ද්විතීයික ආදායම් ශේෂය

(උ) ජංගම ගිණුමේ ශේෂය (ලකුණු 5)

09). i. රටක ආර්ථික වෘද්ධිය මැනීම සිදුකරන ආකාර මොනවාදැයි සඳහන් කොට ආර්ථික වෘද්ධියේ වැදගත්කම් නම් කරන්න. (ලකුණු 4)

ii. රටක ආදායම් විෂමතාව මැනීම සඳහා භාවිත කළ හැකි මිනුම් කවරේද? (ලකුණු 3)

iii. දරිද්‍රතාවය මැනීම සඳහා යොදාගන්නා ජාතික දරිද්‍රතා ඉම සහ ජනගහන දරිද්‍රතා දර්ශකය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අවම කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. ඌණ සේවා නියුක්තිය යනුවෙන් කුමක් අදහස්වේද? ඌණ සේවා නියුක්තිය කෙරෙහි බලපාන සාධක මොනවාද? (ලකුණු 5)

10). i. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහයේ ප්‍රධාන වෙනස්කම් මොනවාද? සංඛ්‍යා දත්ත ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපයීම්වල වැදගත් අංශයක් ලෙස සංචාරක කර්මාන්තය දියුණු කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් වුවත් ඒ සඳහා ශ්‍රී ලංකාව දැනට මුහුණපාන අභියෝග කවරේද? (ලකුණු 5)

iii. දැනුම් ආර්ථිකයක් යනුවෙන් කුමක් අදහස්වේද? දැනුම පදනම් කරගත් ආර්කථියේ වැදගත් සංකල්ප මොනවාද? (ලකුණු 4)

iv. ශ්‍රී ලංකාවේ දේශීය ආර්ථිකයට බලපෑ ගෝලීය අර්බුද පරීක්ෂා කරන්න. (ලකුණු 4)

v. ලෝක බැංකුව විසින් ඉදිරිපත්කොට ඇති මානව ප්‍රාග්ධන දර්ශකයේ සංරචක කවරේද? (ලකුණු 3)

2019 - තෙවන වාර පරීක්ෂණය
13 ශ්‍රේණිය - ආර්ථික විද්‍යාව

<u>පිළිතුරු පත්‍රය</u>

I කොටස

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
1	**5**	11	**1**	21	**2**	31	**5**	41	**2**
2	**4**	12	**5**	22	**4**	32	**3**	42	**3**
3	**5**	13	**4**	23	**2**	33	**4**	43	**4**
4	**4**	14	**1**	24	**4**	34	**2**	44	**1**
5	**2**	15	**4**	25	**1**	35	**4**	45	**5**
6	**4**	16	**1**	26	**3**	36	**3**	46	**2**
7	**2**	17	**5**	27	**2**	37	**5**	47	**3**
8	**5**	18	**3**	28	**4**	38	**5**	48	**1**
9	**1**	19	**5**	29	**1**	39	**2**	49	**2**
10	**4**	20	**2**	30	**4**	40	**3**	50	**4**

ආර්ථික විද්‍යාව ii
පිළිතුරු පත්‍රය
අවසාන වාර පරීක්ෂණය - 2019- 13 ශ්‍රේණිය

1.

I. ආර්ථික නොවන භාණ්ඩ
- මිනිස් ආයාසයකින් තොරව හෙවත් නිෂ්පාදන ක්‍රියාවලියකින් තොරව හට ගන්නා එනම් ස්වභාව ධර්මයෙන් ලැබී ඇති භාණ්ඩ ආර්ථික නොවන භාණ්ඩ වේ.
- පොදු භාණ්ඩ යනු හිඟ සම්පත් යොදා ගනිමින් නිෂ්පාදන කරනු ලබන භාණ්ඩ විශේෂයකි.
- ආර්ථික නොවන භාණ්ඩ පරිභෝජනය කරන විට තවත් පිරිසකට සැපයෙන ප්‍රමාණය අඩු නොවේ.
- එසේම පොදු භාණ්ඩ ගෙවීමක් නොකරන පුද්ගලයින් පරිභෝජනය තුළින් ඉවත් කළ නොහැකි පරිභෝජනයේ තරඟකාරීත්වයක් නොමැති භාණ්ඩ වේ.
- ආර්ථික නොවන භාණ්ඩ වලට උදාහරණ :- වාතය, සූර්යා ලෝකය, නිෂ්පාදන ක්‍රියාවලියක් ඔස්සේ බිහි අතුරු නිෂ්පාදන
- පොදු භාණ්ඩ සඳහා උදාහරණ :- ජාතික ආරක්ෂාව, වීථි ආලෝක කරණය, ඔරලෝසු කණු, ප්‍රදීපාගාර

(කරුණු 2කට ල.2 බැගින් මුළු ල.4යි)

II.
- ආවස්ථික පිරිවැය යනු කිසියම් සම්පතක විකල්ප ප්‍රයෝජන අතුරෙන් එක් විකල්පයක් තෝරා ගත හොත් ඒ වෙනුවෙන් කැප කරන ඊළඟ හොඳම විකල්පයේ වටිනාකමයි. (ල.1)
- ආවස්ථික පිරිවැය ශූන්‍ය වන අවස්ථා
  - සම්පත් අසීමිතව පවතින විට (ආර්ථික නොවන භාණ්ඩ තිබීම)
  - කිසියම් සම්පතකින් විකල්ප ප්‍රයෝජන නොමැති වීම
  - සම්පත් සේවා වියුක්තව පවතින විට (ල.2)

III.

- ආකල්ප සංවර්ධනය
- අධ්‍යාපනය ලබා දීම
- පුහුණුව ලබා දීම
- සානුබල සැපයීම
- නව තාක්ෂණය හඳුන්වා දීම
- භෞතික ප්‍රාග්ධනය ඉහළ නැංවීම
- යහපත් සේවා සේවක සබඳතා ඉහල නැංවීම (ඕනෑම කරුණු 4ට ල. 4යි)

IV. (අ) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් විතැන්වීමක් යනු අක්ෂ දෙකෙන්ම හැකියා වක්‍රය වමට හෝ දකුණට මාරුවීමකි.සාධක සේවා ප්‍රමාණය අඩු වැඩි වීම නිසා හෝ සාධක සේවා වල ඵලදායීතාව අඩු වැඩි වීම නිසා හෝ වක්‍රය විතැන් විය හැකිය. (ල.2)

(ආ) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයට වම්පසින් පිහිටි ලක්ෂයක නිෂ්පාදනය කිරීමෙන් පැහැදිලි වන්නේ සේවා වියුක්ති තත්ත්වයක් හෝ අකාර්යක්ෂම ලෙස සම්පත් භාවිතයට ගැනෙන තත්ත්වයකි. (ල.2)

V. (අ) මූලික ආර්ථික ප්‍රශ්න විසදා ගැනීම සඳහා සමාජයක් තුළ ජීවත් වන මිනිසුන් විසින් නිර්මාණය කරනු ලැබ ඇති යාන්ත්‍රණය හෙවත් ආයතනික වැඩ පිළිවෙල ආර්ථික පද්ධතියක් හෙවත් ආර්ථික සංවිධානයක් ලෙස හැඳින්වේ. (ල.1)

(ආ) විකල්ප ශිල්ප ක්‍රම අතුරෙන් කුමන හෝ එක් ශිල්ප ක්‍රමයක් භාවිත කොට නිපදවීමක් සිදුවන නිසා කෙසේ නිෂ්පාදනය කළ යුතුද යන මූලික ආර්ථික ප්‍රශ්නය නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ්නය ලෙසින්ද හැඳින්වේ. (ල.2)

- මෙම ආර්ථික ප්‍රශ්නය වෙළඳපල ආර්ථික පද්ධතියක විසදා ගනු ලබන්නේ මූලික වශයෙන් මිල ක්‍රමය පදනම් කරගෙනය
- අඩු පිරිවැයක් සහිත සාධක සංයෝග කරමින් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය ශිල්ප ක්‍රමය තෝරා ගනී.
- සාධක වෙළඳපලේ තීරණය වන සාධක මිල ගණන් මගින් නිෂ්පාදකයින්ට අඩු වියදමක් සහිත ශිල්ප ක්‍රමය තෝරා ගැනීමට මඟ පෙන්වනු ලබයි.පිරිවැය අඩු කිරීම මගින් ලාභ වැඩිකර ගැනීමට පෞද්ගලික ව්‍යවසායකයට එමගින් ඉඩ සැලසේ. (ල.2)

2.

I. (අ) - සාමාන්‍ය භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බෑවුම් වන්නේ ,
- . මිල වෙනස් වීමක ආදායම් ප්‍රතිවිපාකය හා
- මිල වෙනස් වීමක ආදේශන ප්‍රතිවිපාකය නිසාය (ල.2)

(ආ) - එළවලු සඳහා සාපේක්ෂ වශයෙන් අනම්‍ය ඉල්ලුමක් පැවතියද ගෝවා සඳහා අනම්‍ය ඉල්ලුමක් පැවති නොහැක.
- හේතුව :- එළවලු යනු පුළුල් නිර්වචනයක් ඇති භාණ්ඩයකි.එබැවින් එළවලු සඳහා ආදේශන අඩුය.ඒ නිසා එළවලු සඳහා අනම්‍ය ඉල්ලුමක් පවතී. (ල.1)
- ගෝවා යනු පටු ලෙස නිර්වචනය කළ භාණ්ඩයක් නිසා ඒ සඳහා ආදේශක බහුල වශයෙන් ඇත.ඒ නිසා ගෝවා සඳහා ඇත්තේ අනම්‍ය ඉල්ලුමක් නොව නම්‍ය ඉල්ලුමකි. (ල.1)

(ඇ) - ඉල්ලුම් වක්‍රය මත සෑම ලක්ෂයකම එක සමාන වූ නම්‍යතා සංගුණක අගයන් පෙන්නුම් කරන අවස්ථා තුනක් ඇත.
- පූර්ණ අනම්‍ය ඉල්ලුම් අවස්ථාව
- පූර්ණ නම්‍ය ඉල්ලුම් අවස්ථාව
- ඒකීය නම්‍ය ඉල්ලුම් අවස්ථාව (ල.3)

II. ඉල්ලුම විතැන්වීම දෙයාකාරයකට සිදු වේ.
එනම් වමට සහ දකුණට විතැන් විමයි.



ඉල්ලුම් වක්‍රය වමට විතැන්වීම



ඉල්ලුම් වක්‍රය දකුණට විතැන්වීම

- ඉල්ලුම් වක්‍රය වමට විතැන් වූ විට සමතුලිත මිල පහළ යන අතර ($P_0 - P_1$) සමතුලිත ප්‍රමාණයද පහළ යයි. (Q_0- Q_1)
- ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වන විට සමතුලිත මිල හා ප්‍රමාණය ඉහළ යයි. (ප්‍රස්තාර 2ට ල.2යි. පැහැදිලි කිරීම් වලට ල.2)

III.

(අ) සමතුලිත මිල හා ප්‍රමාණය

Qd = 200-10p QS = 20+8P

Qd = QS

200-10p = 20+ 8P

200-20 = 8P+10P

180 = 18P ⟶

P = 10 සමතුලිත මිල (ල.1)

Qd = 200 – 10x10

Qd = 100 ⟶ සමතුලිත ප්‍රමාණය (ල.1)

(ආ) ආර්ථික අතිරික්තය =

පාරිභෝගික අතිරික්තය + නිෂ්පාදන අතිරික්තය

පාරිභෝගික අතිරික්තය = (උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල x සමතුලිත ප්‍රමාණය) / 2

= උපරිම ඉල්ලුම් මිල = Qd = 200 – 10p

O = 200 – 10P

10P = 200

P = 20

පාරිභෝගික අතිරික්තය = $\frac{(20 - 10) X 100}{2}$

= 500 (ල.1)

නිෂ්පාදන අතිරික්තය = $\frac{20 + 100 X 10}{2}$

= 600 (ල.2)

ආර්ථික අතිරික්තය = 600 + 500 = 1100 (ල.2)

(ඇ) සමතුලිත මිලේදී සැපයුම නම්‍යතාව

$Q = \frac{\Delta QS}{\Delta P} X \frac{P}{4}$

$= 8 \quad X \frac{10}{100} = 0.8$ (ල.2)

3.

I. නිෂ්පාදකයන් වෙත බදු පැනවීමේදී නිෂ්පාදකයාට ලැබෙන මිලත් ගැනුම්කරු ගෙවන මිලත් තීරණය වීම කෙරෙහි සැපයුම් නම්‍යතාව බලපායි.
මිල සැපයුම් නම්‍යතා පහ අනුව දෙදෙනාගේම මිල වෙනස් වේ. (ල.1)

- පූර්ණ අනම්‍ය සැපයුමකදී,
  - පූර්ණ අනම්‍ය සැපයුම් තත්ත්වයකදී සම්පූර්ණ බදු බර සැපයුම්කරුට දරන්නට සිදුවන නිසා බද්දේ ප්‍රමාණයෙන්ම අඩු වූ මිලක් සැපයුම්කරුට ලැබෙන අතර ගැනුම්කරුට ගෙවන්නට සිදුවන මිල වෙනස් නොවේ.

- අනම්‍ය සැපයුම් තත්ත්වයකදී,
    - අනම්‍ය සැපයුම් තත්ත්වයකදී බද්දෙන් වැඩි ප්‍රමාණයක් සහිතව සැපයුම්කරුට ලැබෙන මිල අඩුවන අතර බද්දෙන් අඩු ප්‍රමාණයක් සහිතව ගැනුම්කරු ගෙවන මිල ඉහල යයි.
- ඒකීය නම්‍ය සැපයුම් තත්ත්වයකදී,
    - ඒකීය නම්‍ය ඉල්ලුම් තත්ත්වයකදී බදු බර දෙදෙනා අතර සමානව බෙදී යාම නිසා සමාන ප්‍රමාණවලින් සැපයුම්කරුට ලැබෙන මිල අඩුවන අතර ගැනුම්කරුට ගෙවීමට සිදුවන මිල ඉහල යයි.
- නම්‍ය සැපයුම් තත්ත්වයතදී,
    - නම්‍ය සැපයුම් තත්ත්වයකදී අඩු බදු ප්‍රමාණයක් සහිතව සැපයුම්කරුට ලැබෙන මිල පහළ යන අතර වැඩි බදු ප්‍රමාණයක් සහිතව ගැනුම්කරුට ගෙවීමට සිදුවන මිල ඉහල යයි.
- පූර්ණ නම්‍ය සැපයුම් තත්ත්වයකදී,
    - පූර්ණ නම්‍ය සැපයුම් තත්ත්වයකදී සම්පූර්ණ බදු බර එකතු වූ මිලක් ගැනුම්කරුට ගෙවන්නට සිදුවන අතර සැපයුම්කරුට ලැබෙන මිල වෙනස් නොවේ.

    (එක් නම්‍ය තාවක් පැහැදිළි කිරිම සඳහා ලකුණු 1 බැගින් ල. 5 යි.) (මුළු ලකුණු 6 යි)

II. (අ) රජයේ සහනාධාර පිරිවැය

20 X 60 = රු. 1200.00 කි. (ල.2)

(ආ) නිෂ්පාදන අතිරික්තය =

$$\text{සහනාධාරයෙන් පසු සැපයුම්කරුට ලැබෙන මිල - අවම සැ.මිල X අලෙවි ප්‍රමාණය X } \frac{1}{2}$$

$$= \frac{50 - 20 - 60}{2} = \underline{900} \quad (ල.2)$$

iii. - ශ්‍රම වෙළඳපලේ අවම වැටුපක් සමතුලිත මිලට ඉහළ මිලක් ප්‍රකාශයට පත් කළ හොත් එහි ප්‍රතිඵලයක් වන්නේ විශාල සේවක පිරිසක් විරැකියාවට පත් විමයි.
- එමෙන්ම වෙළඳපලේ පවතින සීමිත රැකියා ප්‍රමාණය ලබා ගැනීම සඳහා මේ පිරිස තරඟ කරති.
- රැකියා ඇත්තේ සුළු ප්‍රමාණයකි.
  රැකියා අපේක්ෂා කරන පිරිස විශාලය. (කරුණු 2ට ල.4යි)

IV.

❖ කෘෂිකාර්මික භාණ්ඩවල මිල අස්ථායි විමට හේතු
- ආහාර භෝග සඳහා ඇත්තේ 1ට අඩු ඉල්ලුම් නම්‍යතාවකි
- කෙටි කාලයේදි ඒවායේ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර අනම්‍ය ස්වරූපයක් ගැනීම.
- වෙළඳපලේ කෘෂි භෝගවල මිල ශීඝ්‍රයෙන් වෙනස් වුවද ඒවාට ප්‍රතිචාර දක්වමින් සැපයුම අඩු වැඩි කිරීමට ඇති හැකියාව සීමිත විම.
- නියගය,ගංවතුර,කෘමී වසංගත වැනි ස්වාභාවික හේතු නිසා ඇතිවන සැපයුම් කම්පන (කරුණු 3ට ල.3යි)

❖ ස්ථායිතාව රැක ගැනිම සඳහා ආණ්ඩුවට ගත හැකි ක්‍රියාමාර්ග
- සහතික මිල ක්‍රමයක් හඳුන්වා දිම
- ඌන පූර්ණ ගෙවීමේ ක්‍රම ක්‍රියාත්මක කිරීම
- නිෂ්පාදන සලාක හෙවත් කෝටා ලබා දී සැපයුම සිමා කිරීම.
- භූමිය වගාව සඳහා යොදා නොගැනීම දිරිමත් කිරීම් පිණිස ගෙවීමක් කිරිම.
- ස්වාරක්ෂක තොග රැස් කිරිම හා මුදා හැරීම
- අපනයන සහනාධාර ලබා දිම. (කරුණු 3ට ල.3යි)

4.

I.

- කෙටි කාලයේදී නිමැවුම සමඟ වෙනස් නොවන පිරිවැය මුළු ස්ථාවර පිරිවැයයි.මුළු ස්ථාවර පිරිවැය නිමැවුම් මට්ටම සමඟ සම්බන්ධතාවයක් නොපෙන්වයි.නිමැවුම ශුන්‍ය අගයක් ගත්තද ස්ථාවර පිරිවැයක් පවතී.එය කෙටි කාලයේදී නොවැලැක්විය හැකි පිරිවැයකි.ඒ අනුව ස්ථාවර පිරිවැය වක්‍රය පූර්ණ නම්‍ය ස්වරූපයක් ගනී. (ල.2)
- කෙටි කාලින නිෂ්පාදන තුළ නිමැවුම සමඟ වෙනස් වන විචල්‍ය සාධක සඳහා දරන පිරිවැය විචල්‍ය පිරිවැයයි.නිමැවුම වැඩිවන විට විචල්‍ය පිරිවැය වැඩිවන අතර වැඩිවීමේ වේගය විවිධ නිමැවුම් මට්ටම් අතර වෙනස් වේ.ඊට හේතුව විචල්‍ය යෙදවුම්වල ඵලදායිතාව හීනවන ඵලදා නීතියට යටත් විමයි.නිමැවුම ශුන්‍යවන විට විචල්‍ය පිරිවැයද ශුන්‍ය වේ. (ල.2)
- නිෂ්පාදන ක්‍රියාවලියට යොදාගනු ලබන සමස්ථ විචල්‍ය පිරිවැය හා ස්ථාවර පිරිවැය දෙකෙහි එකතුව මුළු පිරිවැයයි.නිමැවුම ශුන්‍ය වුවද ස්ථාවර පිරිවැයක් පවතින මුළු පිරිවැයක්ද පවතී.එම නිසා මුළු පිරිවැය වක්‍රය ආරම්භ වන්නේ ස්ථාවර පිරිවැය ආරම්භවන ලක්ෂයෙනි.නිමැවුම ක්‍රමයෙන් වැඩි කිරීමත් සමඟ මුළු පිරිවැය පහළ නිමැවුම් මට්ටම්වලදී අඩු වන වේගයෙන් හා ඉහළ මට්ටම්වලදි වැඩිවන වේගයකින් ඉහළ යයි. (ල.2)



*ලකුණු ලබා දීම සඳහා ප්‍රස්තාරය අවශ්‍ය නොවේ.

II.

- පූර්ණ තරඟකාරී වෙළඳපලක් කෙටි කාලයේදී ආයතන රාශියකින් සමන්විත හා ආයතන් පැවරුණු මිලක් අනුව ක්‍රියා කරන තත්ත්වයක පසු වේ.ආබාධ පිවිසුමක් හා පිටවුමක් ඇත.
- ආයතනයක් කෙටි කාලයේදී අති ප්‍රාමාණික ලාභ හෝ අවප්‍රාමාණික ලාභ ඉපයිය හැකිය. (ල.1)
- අතිප්‍රාමාණික ලාභ ලැබෙන විට එම අති ප්‍රාමාණික ලාභ ඉවත් වන තුරු අළුත් සැපයුම්කරුවන් වෙළඳ පලට ඇතුළු වේ. (ල.1)
- අවප්‍රාමාණික ලාභ ලබන විට එම අවප්‍රාමාණික ලාභ ඉවත් වන තුරු සැපයුම් කරුවන් කර්මාන්තයෙන් ඉවත් වේ. (ල.1)

දිගු කාලයේදී අළුත් සැපයුම් කරුවන් පිවිසිමක් හෝ පිටවිමක් සිදු නොවන නිසා ආයතනයක් ප්‍රාමාණික ලාභ පමණක් උපයයි.ආබාධ පිවිසුම නිසා මෙය සිදු වේ. (ල.1) (මුළු ලකුණු 3යි)

III. - පූර්ණ තරඟකාරී වෙළඳපල

- නිෂ්පාදිතය සමජාතීය වීම
- ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් සංඛ්‍යාව ඉතා විශාල වීම
- ආයතනය මිල ගනුවෙකු වීම
- ආබාධ පිවිසුම හා පිටවීම
- ගැනුම්කරුවන්ට හා විකුණුම්කරුවන්ට වෙළඳපල පිළිබඳ තොරතුරු පූර්ණ වශයෙන් හා පිරිවැයකින් තොරව ලබා ගත හැකි වීම.
- සාධක සංචලතාවට බාධා නොමැති වීම
- දිගු කාලයේදී ආයතන ප්‍රාමාණික ලාභ පමණක් ලැබීම.

- කතිපයාධිකාරී වෙළඳපල

- සැපයුම්කරුවන් අතිශයින් සීමිත වීම.
- ප්‍රවේශයට දැඩි බාධා පැමිණ වීම
- ආයතන අතර දැඩි අන්‍යෝන්‍ය රැඳියාවක් පැවතීම
- ප්‍රභේදනය වූ හෝ ප්‍රභේදනය නොවූ හෝ භාණ්ඩ නිපද වීම.
- ආයතනය මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය සාපේක්ෂ වශයෙන් අනම්‍ය වූ පහලට බෑවුම් වන එකක් වීම.

(ලක්ෂණ 3ක්වත් දක්වා ඇත්නම් ල.2 බැගින් මුළු ලකුණු 4යි)

IV. (අ) - ආන්තික පිරිවැය වක්‍රය

- සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය
- සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය (ල.3)

(ආ)



ඉහත රූප සටහනට අනුව පූර්ණ තරඟකාරී ආයතනයක කෙටි කාලයේදී භාණ්ඩය අලෙවි කරන මිල එහි සාමාන්‍ය පිරිවැයට වඩා අඩු වුවහොත් පාඩුවක් දැරීමට සිදුවේ. එහෙත් පාඩු සහිතව වුවද ආයතනයක් කෙටි කාලයේදී නිෂ්පාදනයේ යෙදි සිටීමට පෙළඹිය හැකිය.එසේ තීරණය කරනුයේ ආයතනය මුළුමනින් ම වසා දැමුවහොත් දරන්නට සිදු වන පාඩුවට වඩා නිෂ්පාදයේ නිරතවීමෙන් හට ගන්නා පාඩුව අඩු නම් ය.රූප සටහනේ අඳුරු කළ කොටසින් දැක්වෙන්නේ අලාභයේ ප්‍රමාණයයි. (රූප සටහනට ලකුණු 2යි.පැහැදිලි කිරීමට ලකුණු 2යි)

5.

i. ආර්ථික ප්‍රදේශය යනු සඵල ආර්ථික පාලනයක් සහිත තනි ආණ්ඩුවක් යටතේ පුද්ගලයන්ට භාණ්ඩවලට හා ප්‍රාග්ධනයට නිදහසේ සංචලනය විය හැකි භූගෝලීය ප්‍රදේශයකි.එහෙත් මෙහිදි ආර්ථික ප්‍රදේශයේ වපසරිය භූගෝලීය දේශ සීමාවකට පමණක් සීමා වීම අත්‍යවශ්‍ය නොවේ. දේශ සීමාව තුළ සිදු වන සියළුම ආර්ථික ක්‍රියාකාරකම් මෙයට ඇතුලත් නොවන අතර දේශ සීමාවෙන් පිටත සිදු වන ක්‍රියාකාරකම් පවා ඇතුලත් විය හැක.ආර්ථික ප්‍රදේශය සමන්විත වන්නේ නේවාසික ඒකකයන්ගෙන් පමණි. (සුදුසු නිර්වචනයට ල.3යි)

ii. (අ) මූලික මිලට දළ එකතු කළ අගය

කෘෂි අංශයේ දළ එකතු කළ අගය = 4000 - 1000 = 3000

කාර්මික අංශයේ දළ එකතු කළ අගය = 8000 - 3000 = 5000

සේවා අංශයේ දළ එකතු කළ අගය = 12000 - 3600 = 8400

මූලික මිලය දළ එකතු කළ අගය = 16400

(ල.3)

(ආ) නිෂ්පාදකයාගේ මිලට දළ එකතු කළ අගය =

මූලික මිලට දළ එකතු කළ අගය + නිෂ්පාදකයාගෙන් අය කළ නිෂ්පාදිතය මත ශුද්ධ බදු (බදු - සහනාධාර)

= 16400 +1800 - 200 = 18000 (ල.2)

(ඇ) දළ දේශීය නිෂ්පාදිතය =

මූලික මිලට දළ එකතු කළ අගය + සියලුම නිෂ්පාදිත මත (ආනයන ඇතුළුව) ශුද්ධ බදු (බදු - සහනාධාර) + වෙළඳ ආන්තික සහ ප්‍රවාහන ගාස්තු

16400 +(1800 +600+900) – (200 + 500) + 1000 = 20000 (ල.2)

(ඉ) ශුද්ධ දේශීය නිෂ්පාදිතය = දළ දේශීය නිෂ්පාදිතය - ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය

20000 – 1000 = 19000 (ල.2)

(ඊ) දළ ජාතික ආදායම =

දළ දේශීය නිෂ්පාදිතය + ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායම

20000 + (-1200) = 18800 (ල.2)

(සංඛ්‍යා පමණක් දැක්වීම ප්‍රමාණවත් නොවේ. සංඛ්‍යා පමණක් නම් ලකුණු 1 බැගිනි.)

iii. (අ) සමතුලිත නිමැවුම

y = C + I +G

= 200 + 0.8y + 200 + 100

= 500 + 0.8y

Y – 0.08y = 500

Y = 500 / 0.2

Y = 2500 (ල.2)

(ආ)



(අක්ෂ නම් කිරීම ඇතුළුව නිවැරදි දත්ත මත ප්‍රස්තාරය ලකුණු 4ක් හිමි වේ)

6.

i. කිසියම් රටක සමස්ත මුදල් සැපයුමට පදනම සපයන මහ බැංකුව සතු ඍජු මූල්‍ය වගකීම් පදනම් මුදල් ලෙස හැඳින්වේ.මේවා අධි බලැති මුදල් ,සංචිත මුදල් යන නම් වලින්ද හැඳින්වේ. (ල.2)

- පදනම් මුදල් සැපයුමට අයත් වන මහ බැංකුවේ ප්‍රධාන වගකීම් පහත පරිදි වේ.
  - මහජනයා සතු ව්‍යවහාර මුදල්
  - වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල්
  - මහ බැංකුවේ ඇති වාණිජ බැංකු සතු තැන්පතු
  - වෙනත් ආයතන සතුව මහ බැංකුවේ ඇති තැන්පතු (ල.2)

ii. (අ) විනිමය සමීකරණය MV = PT වේ. ඉහත විනිමය සමීකරණයේ V සංසරණ ප්‍රවේගය සහ T ගනුදෙනු සංඛ්‍යාව ස්ථාවර පවතී යැයි උපකල්පනය කළ විට මුදල් තොගය M වෙනස් වූ ප්‍රමාණයට සමානුපාතිකව P මිළ මට්ටම ද වෙනස් වේ.ඒ අනුව මුදල් ප්‍රමාණයේ වර්ධනයත් මිළ මට්ටමත් අතර සමීප සම්බන්ධතාවයක් ඇතැයි නිගමනය කළ හැකිය. (ල.2)

(ආ)

මූර්ත දළ දේශීය නිෂ්පාදිතය = 600

මිල මට්ටම = 2

මුදල සැපයුම = 300

මුදලේ සංසරණ ප්‍රවේගය

$$MV = PT$$

$$V = \frac{PT}{M}$$

සංසරණ ප්‍රවේගය $V = \frac{600 \times 2}{300}$

$= 4//$ (ල.2)

iii. (අ)

වගකීම්	වත්කම්
ඉල්ලුම් තැන්පතු 4000	සංචිත 400
4000	ණය 3600 4000

(ල.2)

(ආ)

වගකීම්	වත්කම්
මුදල් තැන්පතු 2000	සංචිත 400
2000	ණය 1600 2000

(ල.2)

මුදල් සැපයුම = ව්‍යවහාර මුදල් + බැංකු මුදල්

= 400 + 2000

= 2400 (ල.2)

iv. - ආපසු මිලදී ගැනීමේ එකඟතාවය මත මහ බැංකුව සතු සුරකුම් පත් මුදල් වෙළඳපලේ අලෙවි කිරීම ප්‍රති මිළදී ගැනිම ලෙස හඳුන්වයි.එය වර්තමානයේ නිත්‍ය තැන්පතු අනුපාතය ලෙසද හඳුන්වයි.මෙම ප්‍රති මිළදි ගැනුම් මගින් මුදල් වෙළඳපලේ අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගනී. එවිට මුදල් සැපයුම පහළ යන අතර ඒක්ෂන ණය වෙළඳපළේ පොළී අනුපාතය ඉහළ යාමට ද පටන් ගනී. (ල.2)

- ආපසු විකිණීමෙ එකඟතාවය මත මහ බැංකුව මුදල් වෙළපොළෙන් සුරකුම්පත් මිළට ගැනීම ප්‍රති විකුණුම් ලෙස හඳුන්වයි.එය වර්තමානයේ නිත්‍ය ණය පහසුකම් අනුපාතය ලෙසද හඳුන්වයි.මෙම ප්‍රති විකුණුම් මගින් මුදල් වෙලදපොළේ ද්‍රවශීලතා සැපයුම ඉහළ යයි.එවිට මුදල් සැපයුම ඉහළ යයි.එවිටඒක්ෂණ ණය වෙළඳපොළේ පොළි අනුපාතය ද පහළ යාමට පටන් ගනී. (ල.2)

v. -ණය පිළිබඳ උපරිම සීමා නියම කිරීම

-යහ පෙළඹුම්

-වර්ණාත්මක පොළී නියම කිරීම

-ඇප සුරකුම් වෙනස් කිරීම

-බැංකු ණය පාලනය කිරීම (කරුණු 04 ට ලකුණු 02 යි)

7.

i. පරිභෝජනයේ සෘණ බාහිරතා සැලකිලිමත් නොවන විට වෙළඳපල තුළ අධි පරිභෝජනයක් සිදු වේ.එය පහත රූප සටහන මගින් පැහැදිළි කළ හැකිය.



(ලකුණු 02)

අධි පරිභෝජනයට

- මෙම භාණ්ඩය පරිභෝජනය කරන පාරිභෝගිකයා එමගින් පෞද්ගලික ප්‍රතිලාභ හා පෞද්ගලික පිරිවැය පමණක් සැලකිල්ලට ගෙන Q ප්‍රමාණයක් පරිභෝජනය කරයි.
- එහෙත් සමාජ ප්‍රශස්ත පාරිභෝජන මට්ටම වන්නේ Q_1 ප්‍රමාණයයි.වෙළඳපල යාන්ත්‍රණය මගින් සමාජ ප්‍රශස්ථ පාරිභෝජනය පෙන්නුම් නොකරන නිසා Q සිට Q_1 දක්වා අධි පාරිභෝජනයක් පෙන්නුම් කරන බැවින් වෙළඳපොල අකාර්යක්ෂමතා බිහි වී වෙළඳපල අසමත් වීම් සිදු වේ. (ල.2)

ii. - සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම
- බාහිරතා
- සුඛසාධන භාණ්ඩ හා අවගුණ භාණ්ඩ
- පොදු භාණ්ඩ
- සාධාරණ ආදායම් ව්‍යාප්තියක් ඇති කිරීම
- ආර්ථික වර්ධනය හා සංවර්ධනය ඉහළ නැංවීම
- සර්ව ආර්ථික ස්ථායීතාවය ඇති කිරීම
- යටිතල පහසුකම් ඇති කිරීම
- නෛතික රාමුව ස්ථාපිත කිරීම (කරුණු 4ට ලකුණු 4යි)

iii. රාජ්‍ය අයවැයේ වර්තන වියදම් යනු වසරකට අඩු කාලයක් සඳහා රජයේ එදිනෙදා කටයුතු පවත්නා ආකාරයෙන් පවත්වාගෙන යාම සඳහා දරන වියදම් වේ.

උදා :- රාජ්‍ය සේවක වැටුප් ගෙවීම්
ණය පොළී ගෙවීම්

- ප්‍රාග්ධන වියදම් යනු සාමාන්‍යයෙන් වසරකට වැඩි කාලයක් පවතින භාණ්ඩ මිලදී ගැනීමටත් ප්‍රාග්ධන සම්පත් බිහිකර ගැනීමටත් ඒවා ප්‍රතිසංස්කරණය කිරීමටත් දරන්නා වූ වියදම් වේ.

උදා : - යන්ත්‍ර මිළදීගැනීම
ගොඩනැගිලි ඉදි කිරීම
මාර්ග ඉදි කිරීම

- ශුද්ධ ණය වියදම් යනු වර්තන හා ප්‍රාග්ධන වියදම් වලට ඇතුලත් නොවන රජය විසින් දරනු ලබන වියදම් වේ.අත්තිකාරම් ගිණුම් මගින් ලබා දෙන ශුද්ධ ණය දීම් ණය ආපසු ලැබීම් රාජ්‍ය ව්‍යවසායන් සඳහා ණය ලබා දීම් මෙයට ඇතුලත් වේ (ල.3)

iv. -ආදායම් බදු
- එකතු කල අගය මත බදු
- නිෂ්පාදන බදු
- ආනයන බදු
- බලපත්‍ර ගාස්තු
- වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු
- සෙස් බදු
- ජාතිය ගොඩ නැගීමේ බදු (1 කට 1 බැගින් ලකුණු 4 යි)

V. - ප්‍රසාරණාත්මක ණය මාර්ග
- රජය මහ බැංකුවෙන් ණය ලබා ගැනීම
- රජය වාණිජ බැංකුවලින් ණය ලබා ගැනීම (ල.2)
- ප්‍රසාරණාත්මක නොවන ණය මාර්ග
- ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ණය ලබා ගැනිම
- සේවක අර්ථ සාධක අරමුදලෙන් ණය ලබා ගැනීම
- මහ ජනතාවගෙන් ණය ලබා ගැනිම (ලකුණු 03)

8.

i. <u>අත්සන් කර ඇති වෙළඳ ගිවිසුම්</u>
- ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම
- පාකිස්ථානු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම
- ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම
- ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (කරුණු 2ක් සඳහා ල.2යි)

<u>සාකච්ඡා මට්ටමේ පවත්නා වෙළඳ ගිවිසුම්</u>
- BIMSTEC ගිවිසුම
- ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA)
- චීන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම
- සේවා වෙළඳාමට අදාළ සාර්ක් ගිවිසුම (කරුණු 2ක් සඳහා ල.2යි)

ii. - පර්යේෂණය හා සංවර්ධන ක්ෂේත්‍රයෙහි විශාල හැකියාවක් තිබීම.නව්‍යතා හඳුන්වා දීම
- බුද්ධිමය දේපළ හිමිකාරිත්වය , සන්නම්, වෙළඳ නාම, ස්වාධිකාර ,ප්‍රස්ථාර
- බෙදා ගැනීමේ ජාල පිළිබඳ සුවිශේෂී හිමිකමක් තිබීම.
- ප්‍රාග්ධන උපකරණ හිමිකාරිත්වය

උදා :- ඛණිජ තෙල් ගවේෂණ
ගොඩනැගිලි ඉදි කිරීම්
පතල් කැණීම

- ශක්තිමත් අලෙවිකරණ උපාය මාර්ග තිබීම.
- විශිෂ්ට කළමනාකරන කණ්ඩායම් සිටීම. (කරුණු 2ක් සඳහා ල.2යි)

iii. - ස්ථාවර විනිමය අනුපාතිකය හා නම්‍ය විනිමය අනුපාතිකය යන ක්‍රම දෙකෙහි දක්නට ඇති යහපත් ලක්ෂණ වලින් වාසි ලබා ගැනීම සඳහා සකසා ගනු ලැබූ එම ක්‍රම දෙකෙහිම සංකලනයක් ලෙස පාලිත නම්‍ය විනිමය අනුපාතය හැඳින්විය හැකිය.

- මෙහිදී මූල්‍ය අධිකාරිය විසින් දේශීය මුදල් ඒකකය සඳහා ස්ථාවර විනිමය අනුපාතයක් තීරණය කොට එය එක්තරා පරාසයක් තුළ දෝලනය වීමට ඉඩ හැර එම පරාසය ඉක්මවා විනිමය අනුපාතය වෙනස් වන විට මහ බැංකුව විදේශ විනිමය විකිනීම සහ මිලට ගැනීම මගින් දෝලනය පාලනය කරයි. (ල.2)

විනිමය අනුපාතය වෙනස් වීමට පහත සාධක බලපායි.

- ජාත්‍යන්තර වෙළඳාම
- ප්‍රාග්ධන සංචලන
- මිළ විචලනය
- සම පේක්ෂණය
- ආර්ථික ශක්තිය
- රාජ්‍ය ප්‍රතිපත්ති
- කොටස් වෙළඳපල කටයුතු
- දේශපාලනික තත්ත්වය (ල.3)

iv. - නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ ආර්ථිකයකට ගලා එන සියලු විදේශ ලැබීම් සහ ආර්ථිකයෙන් බැහැරට ගලා යන සියලු විදේශ ගෙවීම් අතර වෙනස විදේශ සම්පත් පරතරය ලෙස හැඳින්වේ.

විදේශ සම්පත් පරතරය = විදේශ ලැබීම් - විදේශ ගෙවීම් (ල.2)

- විදේශ වත්කම් යනු රටක් වෙනුවෙන් වෙනත් රටවල මහ බැංකු වල තැන්පත් කර තිබෙන විදේශ මුදල් සහ සුරකුම් පත්‍ය.
- විදේශ වත්කම් ශ්‍රී ලංකා මහ බැංකුවේත්, තැන්පතු භාර ගන්නා ආයතන වලත් ශ්‍රී ලංකා රජයත් සතුව පවතී (ල.2)

v. (අ) වෙළඳ ශේෂය = වෙළඳ භාණ්ඩ + මූල්‍ය නොවන රන්

වෙළඳ භාණ්ඩ

අපනයන	100	
ආනයන	(120)	
		- 20

මූල්‍ය නොවන රන්

ලැබීම්	50		
ගෙවීම්	(110)		
		- 60	
වෙළඳ ශේෂය		- 80	(ල.1)

(ආ) භාණ්ඩ සේවා ගිණුමේ ශේෂය = වෙළඳ ශේෂය + සේවා ගිණුමේ ශේෂය

වෙළඳ ශේෂය - 80

සේවා ගිණුම් ශේෂය

- මුහුදු ප්‍රවාහන ලබීම්	220		
- මුහුදු ප්‍රවාහන ගෙවීම්	(80)		
		140	
- ගුවන් ප්‍රවාහන ලැබීම්	150		
- ගුවන් ප්‍රවාහන ගෙවීම්	(60)		
		90	
- සංචාරක ලැබීම්	140		
- සංචාරක ගෙවීම්	(100)		
		40	
- මූල්‍ය සේවා ලැබීම්	250		
- මූල්‍ය සේවා ගෙවීම්	300		
		- 50	
- විදුලි සංදේශ සේවා ලැබීම්	75		
- විදුලි සංදේශ ගෙවීම්	60		
		15	
භාණ්ඩ හා සේවා ගිණුම් ශේෂය		155	(ල.1)

(ඉ) ප්‍රාථමික ආදායම් ගිණුම

- ලාභාංශ ලැබීම්	100		
- ලාභාංශ ගෙවීම්	(80)		
		20	
- පොලී ලැබීම්	130		
- පොලී ගෙවීම්	35		
		95	
ප්‍රාථමික ආදායම් ශේෂය		115	(ල.1)

(ඊ) ද්විත්ව ආදායම් ගිණුම

- රජයේ සංක්‍රාම ලැබීම්	25	
- සේවා නියුතක්ති ප්‍රේෂණ ලැබීම්	340	
- සේවා නියුතක්ති ප්‍රේෂණ ගෙවීම්	(40)	
ද්විත්ව ආදායම් ශේෂය	325	(ල.1)

(උ) ජංගම ගිණුමේ ශේෂය

- භාණ්ඩ සේවා ගිණුමේ ශේෂය	155	
- ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය	115	
- ද්විත්ව ආදායම් ගිණුමේ ශේෂය	325	
	595	(ල.1)

9.

i. ආර්ථික වෘද්ධිය මිනුම් කිරිම සඳහා ක්‍රම දෙකක් භාවිතා කරයි.

- කාලයත් සමඟ මූර්ත දල දේශිය නිෂ්පාදිතයෙහි හෝ මූර්ත ශුද්ධ දේශීය නිෂ්පාදිතයෙහි හට ගන්නා වෙනස් වීම් මඟින්
- කාලයත් සමඟ ප්‍රතිශීර්ෂ මූර්ත දළ දේශිය නිෂ්පාදිතයෙහි හෝ ප්‍රතිශීර්ෂ මූර්ත ශුද්ධ දේශීය නිෂ්පාදිතයේ හට ගන්නා වෙනස් වීම් මගින් (ල.2)

ආර්ථික වෘද්ධියේ වැදගත්කම

-ජීවන තත්ත්වය ඉහළ යාම
- සේවා නියුක්තිය ඉහල යාම
- සාර්ථක රාජ්‍ය මූල්‍ය කළමණාකරණයක් පවත්වාගත හැකි විම.
- ආයෝජන - ශක්තිමත්විම
- ව්‍යාරිකයන්ගේ ලාභ වැඩි වීම
- දරිද්‍රතාව පහල යාම
- වැඩි භාණ්ඩ හා සේවා ප්‍රමාණයක් පරිභෝජනය කළ හැකි වීම
- වර්ධනයේ ප්‍රතිලාභ විෂමතාවයකින් තොරව බෙදී ගිය හොත් සංවර්ධනය කරා ලඟා විය හැකි වීම

(කරුණු 4 කට ලකුණු 2)

ii. - ලෝරන්ස් වක්‍රය
- ගිනි සංගුණකය
- පංචමක අපකිරණ අනුපාතය (ල.3)

iii. ජාතික දරිද්‍රතා ඉම යනු මූලික අවශ්‍යතා සඳහා වැඩිවන වියදම් පදනම් කරගත් ක්‍රම වේදයකට අනුව දෛනික ඒක පුද්ගල ආහාරමය ශක්ති පරිභෝජන අවශ්‍යතා සහ ආහාර නොවන අත්‍යවශ්‍ය පරිභෝජන අවශ්‍යතා සපුරා ගැනිමට අදාළව පිහිටුවා ඇති නිරපේක්ෂ දරිද්‍රතා රේඛාවකි.

- මෙය ගනණය කරනු ලබන්නේ මසකට පුද්ගලයකුට අවශ්‍ය කැලරි ප්‍රමාණය සඳහා අවශ්‍ය ආහාර සහ ආහාර නොවන අත්‍යවශ්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වැය කරන මුදල් පදනම් කරගෙනය. (ල.2)
- ජනගහන දරිද්‍රතා දර්ශකය යනු දරිද්‍රතා ඉමට පහළින් සිටින දිළිඳු ජනගහන ප්‍රමාණය මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි.
- එය පහත පරිදි ගණනය කරනු ලබයි.

$$\text{ජනගහන දරිද්‍රතා දර්ශකය} = \frac{\text{දරිද්‍රතා ඉමට පහළින් සිටින ජන කොටස}}{\text{මුළු ජනගහනය}} \times 100$$

(ල.2)

iv. - දිළිඳු ජන කොටස් වල ජීවන තත්ත්වය උසස් කිරිමට ඇති අවස්තා පුළුල් කිරිම ඒ සඳහා රැකියා අවස්ථා බහුල කිරිම ,සෞඛ්‍ය පහසුකම් සැපයිම,කුඩා පරිමාණ ව්‍යාපාර ශක්තිමත් කිරිම කල හැකිය.
- තිරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වන කොටස් සවිබල ගැන්වීම ඒ සඳහා තොරතුරු ලබා ගැනීමේ හැකියාව පුළුල් කිරීම රාජ්‍ය පරිපාලනය පහසු කිරිම කළ හැකිය.
- අනාරක්ෂිත තත්ත්වයෙන් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය රැකවරණය ලබා දීම ඒ සඳහා බෝ නොවන රෝග පාලනය කිරිම,රක්ෂණ ආවරණ ලබා දීම ,සහනාධාර සැපයිම කළ හැකිය.

(කරුණු 2ක් නම් කර පැහැදිළි කිරිම සඳහා ල. 4යි)

v. - ඌන සේවා නියුක්තිය යනු ශ්‍රම සම්පත පූර්ණ ලෙස සේවා නියුක්ත නොවීම හෙවත් ශ්‍රමය ඌන උපයෝජනය වී තිබීමයි. (ල.2)

- ඌන සේවා නියුක්තිය සඳහා පහත සාධක බලපායි.
- පවතින රැකියා සහ රැකියා ඉල්ලුම් කරුවන්ගේ සුදුසුකම් අතර නොගැලපීම
- රැකියා වෙළඳපලට අවශ්‍ය නිපුනතා බිහි කිරිමට රජය අපොහොසත් වීම
- ශ්‍රම බලකායේ වර්ධනයට සාපේක්ෂව ආර්ථික වර්ධනයක් සිදු නොවීම
- ආයතනය තුළ අවශ්‍ය ප්‍රමාණයට වඩා සේවකයින් රඳවා ගැනීම (කරුණු 3 කට ලකුණු 3යි)

10. I. වර්තමාන ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහයේ පහත ආකාරයේ වෙනස්කම් රැසක් සිදු වී තිබේ.

ආර්ථිකයේ ව්‍යුහය	දළ දේශීය නිශ්පාදිතයට දායකත්වය
1. කෘෂි කාර්මික අංශය	6.9%
2. කාර්මික අංශය	26.8%
3. සේවා අංශය	56.8% (දත්ත 3 ම ඇතිනම් ල.2 යි)

- මේ අනුව කෘෂි කාර්මික අංශයෙන් දළ දේශීය නිෂ්පාදනයට දක්වන සාපේක්ෂ දායකත්වය ඉතා පහල මට්ටමක පවතී. උදා 6.9%
- කාර්මික අංශයෙන් දළ දේශීය නිශ්පාදිතයට දක්වන සාපේක්ෂ දායකත්වය කෘෂිකාර්මික අංශයේ දායකත්වයට වඩා ඉහළ අගයක් ගෙන තිබේ.
- සේවා අංශයෙන් දළ දේශීය නිශ්පාදිතයට දක්වන සාපේක්ෂ දායකත්වය කෘෂිකාර්මික හා කාර්මික යන අංශ දෙකටම වඩා ඉහළ වැදගත් කමක් ගෙන තිබේ.සේවා අංශය ආර්ථිකයේ වැදගත්ම අංශය බවට පත් වී තිබේ.
  - කෘෂි කාර්මික සේවා නියුක්තිය අඩු වී ඇත.
  - කාර්මික අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය වැඩි වී ඇත.
  - සේවා අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය වැඩි වී ඇත.

(එක් කරුණක් සඳහා ල. 1 බැගින් ල.2යි)

ii. සංචාරක කර්මාන්තය මුහුණ පාන අභියෝග
- සංචාරකයින් සඳහා හෝටල් කාමර ප්‍රමාණවත් නොවීම.
- සංචාරක කර්මාන්තයේ නියැලෙන ශ්‍රමිකයන්ගේ හිඟය
- සංචාරකයන් සඳහා අවශ්‍ය පහසුකම් සපුරාලීමේ අභියෝග
- කර්මාන්තය තුල සැලකිය යුතු අවිධිමත් අංශ ක්‍රියාත්මක වීම.
- සංචාරකයින්ට සේවා සපයන්නා වූ බහුකාර්ය සංචාරක තොරතුරු මධ්‍යස්ථාන ප්‍රමාණවත් ලෙස නොමැති වීම.
- ලෝක ප්‍රසිද්ධ හෝටල් දාම ශ්‍රී ලංකාව වෙත දක්වා ඇති අවධානය ප්‍රමාණවත් නොවීම.
- සංචාරක කර්මාන්තයේ නියලුණු සියලුම පාර්ශවකරුවන් අධීක්ෂණය සඳහා යොමු වූ ක්‍රියාවලියක් නොමැති වීම.
- ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් සංචාරකයින්ගේ අනාරක්ෂිත භාවය

(කරුණු 1 සඳහා 1 බැගින් 5)

iii. දැනුම් ආර්ථිකයක් යනු බුද්ධිමය ප්‍රාග්ධනය මත පදනම් වූ පරිභෝජන සහ නිෂ්පාදන ක්‍රියාවලියකි.ආර්ථික වෘද්ධිය හා සංවර්ධන ඉහළ නැංවීම සඳහා යොමු වූ ආර්ථිකයක් මෙයින් අදහස් වේ. (ල.1)

- දැනුම් ආර්ථිකයක පහත ලක්ෂණ දක්නට ලැබේ.
  - ❖ ආර්ථිකය තාක්ෂණය සමඟ දැඩි සම්බන්ධතාවක් පැවතිම
  - ❖ නව්‍යතා සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දීම
  - ❖ අධ්‍යාපනය පර්යේෂණය හා තාක්ෂණය සඳහා විශාල ආයෝජනයක් කිරීම

(ල.2)

-දැනුම් ආර්ථිකය හා සම්බන්ධධ වැදගත් සංකල්ප පහත පරිදි වේ.
  - ❖ දැනුම්කරුවන්
  - ❖ දැනුම් ඉංජිනේරුවන්
  - ❖ දැනුම් ප්‍රාග්ධනය
  - ❖ බුද්ධිමය ප්‍රාග්ධනය
  - ❖ බුද්ධිමය දේපල (කරුණු 2කට ලකුණු 2යි)

iv. - ආසියාතික මූල්‍ය අර්බුද
  ආසියාතික කලාපයේ විදේශ ව්‍යවහාර මුදල් දැඩි ලෙස අව ප්‍රමාණය වීම නිසා එම කලාපයෙන් ආනයන කරන භාණ්ඩ මිල ඉහළ යාම.
- යුරෝපා ආර්ථික අර්බුදය
  මේ නිසා ශ්‍රී ලංකාවේ අපනයන වල හා විදේශ සේවා නියුක්තිය පහල යාම
- ඉරාකය,සිරියාව,ඇෆ්ගනිස්ථානය ආදී රටවල ඇති වූ යුද ගැටුම්
  මේ නිසා ඛනිජ තෙල් සහ රත්‍රන් මිල ඉහළ යාම.
- ලෝක ආහාර හිඟය
  මේ නිසා කිරිඟු පිටි,කිරිපිටි,සීනි වැනි භාණ්ඩ මිල ඉහල යාම.
- ගෝලීය උෂ්ණත්වය ඉහල යාම සහ ස්වාභාවික උපද්‍රව
  මෙය නිසා ශ්‍රී ලංකා ආර්ථිකයට දැඩි බලපෑම් ඇති වේ.

(කරුණු 4ට ල.4යි)

v. - ළමා වියේදී මරණයට පාත්‍ර නොවීම.
- පාසල් යාමට අපේක්ෂිත වසර හා අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය
- සෞඛ්‍ය පහසුකම් තත්ත්වය

(ල.3)